රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2015

මගේ අංකය : EST/8/ALLOW/03/121 vol.04
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2015.06.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම

රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන් සඳහා 2015.06.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂ දීමනාවක් 2015.07.01 දින සිට ගෙවීමට තීරණය කර ඇත.

| සුදුසුකම් ලබන නිලධරයන් | | මසකට දීමනාව |
|---|---|---|
| (අ) | විධායක සේවා ගණයේ වසර 06කට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 3000/- |
| (ආ) | විධායක සේවා ගණයේ වසර 06ක් හෝ එයට වැඩි සහ වසර 11ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 5000/- |
| (ඇ) | විධායක සේවා ගණයේ වසර 11ක් හෝ එයට වැඩි සහ වසර 19ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත පළමු ශ්‍රේණියේ හෝ එයට ඉහළ ශ්‍රේණියක නිලධරයන් | රු.10000/- |
| (ඈ) | විධායක සේවා ගණයේ වසර 19ක් හෝ එයට වැඩි සක්‍රීය සේවා කාලයක් සහිත පළමු ශ්‍රේණියේ හෝ එයට ඉහළ ශ්‍රේණියක නිලධරයන් | රු.15000/- |

02. එක් එක් සේවාවන්හි සුවිශේෂීත්වය වෙනුවෙන් දැනට විශේෂ දීමනාවක් ලබා දෙන්නේ නම් එකී සේවාවල නිලධරයන්හට මෙම දීමනා හිමි නොවේ. තව ද එකී සේවාවන්හි නිලධරයන්හට ගෙවනු ලබන එම දීමනාව, ඉහත (අ), (ආ), (ඇ) හෝ (ඈ) යටතේ සුදුසුකම් ලබන නිලධරයන්හට ගෙවනු ලබන දීමනාවට වඩා අඩු දීමනාවක් නම්, එම දීමනා ලබන්නන්හට දැනට ලබන දීමනාව සහ ඉහත (අ), (ආ), (ඇ) හෝ (ඈ) හි සඳහන් දීමනා අතර පවතින වෙනස පමණක් ගෙවනු ලැබිය යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය